# 8 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

# දෙවන වාරය

සැකසුම : චන්ද්‍රිකා විජයසිරි
හදපාන්ගොඩ මහා විද්‍යාලය

# එකමුතුව දිවි ගෙවමු



## 12 පාඩම

# ආගමික සහනශීලිත්වය පිළිබඳ බුදු සිරිතෙහි නිදසුන්

ජන වර්ග හා ආගම් භේදයකින් තොර ව සියලු දෙනා සමග සහයෝගයෙන් කටයුතු කිරීමට බුදු දහම මග පෙන්වන අතර මේ සඳහා බුදු සිරිතෙන් නිදසුන් රැසක් පෙන්වා දෙයි.

1. ජෛන ආගමික ශාස්තෘවරයාගේ ප්‍රධාන දායක උපාලි ගෘහපති දිනක් බුදුරදුන් හමුවට පැමිණෙන්නේ බුදුරදුන් හා වාද කොට පරදවා සිය දහමෙහි ඉගැන්වීම් නිවැරදි බව තහවුරු කිරීමටය.

   එහෙත් අවසානයේදී උපාලි තමා එතෙක් එල්බ සිටි මතයේ නිරර්ථක බව තේරුම් ගෙන බෞද්ධ ශ්‍රාවකයකු බවට පත් විය.
   එහි දී බුදුරදුන් උපාලි හට දුන් උපදේශය වූයේ ජෛන ශාස්තෘවරයාට සිදු කරන උපස්ථාන එලෙසින් ම ඉටු කරන ලෙසය.

2. තමාට අප්‍රිය දේ අන් අයට ද අප්‍රිය බැවින් තමා උපමා කොට අන් අය හිංසාවට පීඩාවට ලක් නොකළ යුතු බව වේළුද්වාර සූත්‍රයේ දී බුදුරදුන් පෙන්වා දීම.

❖ බර්ට්‍රන්ඩ් රසල් නම් දාර්ශනිකයා පවසන්නේ,
ඔහු බුදුදහම අගය කරන්නේ එමගින් කිසිවකු හිංසාවට පීඩාවට පත් නොකරන නිසා බව යි.

# ශ්‍රී ලාංකික බෞද්ධ ජන සමාජයේ ආගමික සහනශීලී ගුණය දක්නට ලැබෙන ආකාරය

මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකාගමනයත් සමගින් ලක් වැසියන් බුදු දහම සිය ජීවන පැවැත්මට වැඩි වැඩියෙන් නැඹුරු කර ගන්නා ලදි.

## එලෙස ඇති කර ගත් උසස් මානව ගුණාංග

- පරෝපකාරය
- අවිහිංසාව
- ආගන්තුක සත්කාරය
- සහයෝගයෙන් ජීවත් වීම
- අන් අයගේ අදහස්වලට ගරු කිරීම
- චාම් බව
- සරල බව






# ආගමික සහනශීලී ගුණය අතීතයේ සිට මෙරට පැවති බවට ලාංකික ශාසන ඉතිහාසයෙන් ගත හැකි උදාහරණ

1. වරින් වර විදේශ ආක්‍රමණ එල්ල වුවත් විවිධ ආගම් ඇදහූ එම විවිධ ජාතික ආක්‍රමණිකයින් සමග සහජීවනයෙන් කටයුතු කිරීම.
2. එළාර වැනි විදේශ ආක්‍රමණික රජවරු දිගු කාලයක් මෙරට පාලනය කිරීම හා එළාර රජු දුටුගැමුණු රජු සමග සටන් කොට පරාජය වී මිය ගිය පසු නිසි ගෞරව දක්වා ඔහු වෙනුවෙන් සොහොනක් කරවීම.
3. පැරණි රජවරු වෙහෙර විහාර වැව් අමුණු ඉදි කිරීමේදී ඒ වටා සියලුම ලාංකික ජනතාව ඒකරාශී වීම.

4. බුදු දහම නිසා ලාංකිකයින්ගේ සමාජ සම්බන්ධතා වැඩි වීම.
දෙමාපියන්-දූදරුවන්, ගුරුවරුන්-සිසුන්, අඹු-සැමියන්, හිත-මිතුරන්, දැසි-දස්සන්, පැවිදි උතුමන්-ගිහියන්

5. පැරණි ලාංකිකයින් තුළ දානය, ප්‍රියවචනය, සමානාත්මතාව, අර්ථචර්යාව යන සතර සංග්‍රහ වස්තු පැවතීම.

6. පින්තාලි තැබීම හා අම්බලම පැරණි ලාංකිකයින්ගේ සාමයේ සහජීවනයේ සංකේතයක් වීම.

7. විහාරස්ථාන අසල හෝ විහාරස්ථාන තුළ දේවාල ඉදි කිරීම පිළිබඳ සිංහල බෞද්ධයා විසින් විරෝධයක් පළ නොකිරීම.

8. පටිමාසර ඉදි කිරීමේ දී දකුණු ඉන්දීය හා හින්දු ගෘහ නිර්මාණ සම්ප්‍රදායයන් අනුගමනය කිරීම.

9. දළදා මැඳුර වැද පුදා ගැනීමෙන් අනතුරුව සතර මහා දේවාලවල දෙවියන්ට පිං දීම.

10. කතරගම දේවාලයට යෑම

11. ශ්‍රීපාදස්ථානය පිළිබඳ අනාගමික ආගමික විශ්වාස පැවතියත් විවාදාපන්න ව ගැටුම් ඇති කර නොගෙන ශ්‍රීපාදය වන්දනා කිරීම.

12. වර්තමානයේදී වෙසක්, පොසොන්, නත්තල්, දීපවාලී, රාමසාන් ආදී උත්සව ආගමික භේදයකින් තොර ව සැමරීම හා සංග්‍රහ කර ගැනීම.

13. විවිධ ආපදාපන්න අවස්ථාවල දී භේදයකින් තොර ව එකිනෙකාට උදවු උපකාර කර ගැනීම.

ආගමික සහජීවනය උසස් ගුණාංගයක් ලෙස බුදු දහමේ අගය කළත් සියලු ආගම් ඇදහිය යුතු බවක් එමගින් අදහස් නොවේ. ඒ ඒ ආගමිකයින්ට බාධාවකින් තොරව තම තමන්ගේ ආගම් ඇදහීමටත් සිරිත් විරිත් සිදු කිරීමටත් අවස්ථාව දිය යුතු ය.






# පාසල් දරුවන්ට ගත හැකි ආදර් ශ

- පාසල තුළ හෝ පන්ති කාමරය තුළ සිටින විවිධ ජාතීන්ට අයත් සිසුන් සමග සහයෝගයෙන් කටයුතු කළ යුතු ය. ඒ සඳහා,
  - ඔවුන්ගේ අදහස්වලට සවන් දීම
  - තමාට ලැබෙන සම්පත් අරපිරිමැස්මෙන් බෙදා හදා ගැනීම
  - ගැටලු සහගත අවස්ථාවල දී ගැටුම් ඇති නොකර ගෙන සාවධානව ඒවා විසදා ගැනීම
  - එකිනෙකාගේ සිත් රිදෙන අයුරින් හෙළා තළා කටයුතු නොකිරීම

# අභ්‍යාසය

1. ආගමික සහනශීලීත්වය හා සහජීවනය බුදු සිරිතෙන් ඉස්මතු වන අවස්ථා
   දක්වන්න.

2. ශ්‍රී ලාංකික ජන සමාජය අතීතයේ සිට සාමයෙන්, සමගියෙන් ජීවත් වූ
   බවට නිදසුන් ලියන්න.

3. ආගමික සහජීවනය සඳහා සියලු ආගමික සිරිත් අනුගමනය කිරීම
   අවශ්‍ය ද? හේතුව ලියන්න.